# ලංසු කැඳවීම
# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව
# ආරක්ෂක සේවය ලබාගැනීම - 2025
# ලංසු අංකය - SD/II/2025

01. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2025/26 වාර්ෂික අවශ්‍යතා ප්‍රසම්පාදනයට අදාලව සියළුම පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල සහ ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ආරක්ෂක සේවය ප්‍රසම්පාදනය සඳහා මුද්‍රා සහිත ලංසු ඉදිරිපත් කිරීමට කරනු ලබන ආරාධනයයි.

02. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය මත සිදු කරන අතර ඉදිරිපත් කළ හැකි අවම ඒකකය එක් දිස්ත්‍රික්කයක් තුළ පිහිටි මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් සියළුම කාර්යාල වේ.

03. ඒ සඳහා උනන්දුවක් දක්වන ලංසු තබන්නන් හට පහත වගුවෙහි සඳහන් ලිපිනයන්හීදි කාර්යාල වේලාවන් තුල ලංසු කැඳවීමේ ලිපි ලේඛන අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල වලදි පරික්ෂා කළ හැකි අතර අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයන්හි දුරකථන අංක ඇමතීමෙන් වැඩිදුර තොරතුරු ලබා ගත හැක.

04. රුපියල් දහස (රු.1,000.00) ක් බැගින් නැවත නොගෙවන මුදලින් 2025.07.21 වන දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා කරනු ලබන ගෙවීම් මත කාර්යාල වේලාව තුළ අදාල පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල වෙත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු තබන්නන්ට ලංසු කැඳවීමේ සම්පූර්ණ ලේඛන කට්ටලය සහ අයදුම්පත ලබා ගත හැකි අතර ලංසු පත්‍රය සම්පූර්ණ කිරීම සඳහා ලබාදෙන උපදෙස් පත්‍රිකාවෙහි සඳහන් උපදෙස් හොඳින් අධ්‍යානය කර කටයුතු කරන මෙන් දැනුම්දෙමු.

05. ඉදිරිපත් කරන ලංසු වල වලංගු කාලය ලංසු විවෘත කරන දින සිට දින 50 (2025.09.10 දින දක්වා) කට වලංගු විය යුතුය.

06. පූර්ව ලංසු රැස්වීම 2025.07.08දින පෙ.ව. 10.00 ට අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලවලදි පැවැත්වේ.

07. ලංසු භාර ගැනීම 2025.07.22 දින පෙ.ව. 09.00 ට අවසන් කරන අතර ලංසු භාරගැනීම අවසන් වූ වහාම අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලවලදි ලංසු විවෘත කරනු ලැබේ.

| අනු අංකය | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය | ලිපිනය | දුරකතන අංකය |
|---|---|---|---|
| 01. | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (වයඹ) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය,උඩවල්පොල පාර, කුරුණෑගල | 037-2224062 |
| 02. | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (දකුණ) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, පහළ ඩික්සන් පාර, ගාල්ල | 091-2234195 |
| 03. | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (ඌව) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, පල්ලිය පාර, බදුල්ල | 055-2222037 |
| 04. | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (සබරගමුව) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, නව නගරය, රත්නපුර | 045-2222935 |
| 05. | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (උතුරුමැද) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, අනුරාධපුරය | 025-2222960 |
| 06. | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (නැගෙනහිර) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ඇතුළු වරාය පාර , ත්‍රිකුණාමලය | 026-2222170 |
| 07. | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය , නො.150, බර්නාඩ් සොයිසා මාවත, කොළඹ 05 | 011-2587234 |

සර්වේයර් ජනරාල්
2025.06.27